■ මිතුන් ජයවර්ධන

ලක්ෂ 780ට දඩය ලක්ෂ 75යි ලක්ෂ 800ට - විපක්ෂ නායක ලක්ෂ 700යි: අලුත් අණපනත් ගේන්නේ මෙහෙම රටකද?

කපුටන්ගේ පනතට මුල්තැන සජබ පනත කුණු බක්කියට

අනි ඉදිරිපත් කළ සංශෝධනවලින් සියයට 75ක් පිළි අරගෙන තිබෙනවා. හැබැයි ප්‍රතික්ෂේප කර තිබෙන සියයට 25 බොහොම බරපතළ දේවල්. ගරු අමාත්‍යතුමනි, දැන් මොහොතද ප්‍රතික්ෂේප කර තිබෙන්නේ අපි යෝජනා කර තිබෙනවා, අත්තියට බලපාන ලෙස මේ නීතිය ක්‍රියාත්මක කළ යුතුය කියා. විශේෂයෙන්ම එක්සත් ජාතිවරුන්ගේ දුක්ඛ විරෝධී සම්මුතියය ශ්‍රී ලංකාව අපරාධුතත කළ දින සිට ක්‍රියාත්මක වීය යුතුයි කියා එක අපි යෝජනා කර තිබෙනවා. රජය ඒ සංශෝධනය ප්‍රතික්ෂේප කර තිබෙනවා. හොරකම් කරන ලද වත්තු ශ්‍රී ලංකා රජය ගැනීම සිදු කරන්න ඕනෙ. ඒ වගේම අධිවේදනා පනතු ඉල්ලා අස්කර ගැනීම සම්බන්ධ ක්‍රියාවලියේ පසෙදිලි සාධනීය, නීතානුකූල වෙනසක් සිදුකිරීමේ සංශෝධන අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒනත් රජය ප්‍රතික්ෂේප කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ රටේ ජනාධිපතිවරයා සමුගිය දවස්වල ප්‍රකාශ කරලා තිබුණා පාතික අවශ්‍යතාව මත කටයුතු කරන්න ඕනෙ. දේශපොලනය පැත්තක දමලා පාතික අවශ්‍යතාවට මුල් තැන දෙන්න ඕනෙ. ඒ වාගේම පටු දේශපොලන වාදඝන්ද පසෙක දමලා දේශපොලන සේවීය කොළු රට වෙනුවෙන් පෙනී ඉඳලා වැඩ කටයුතු කරන්න ඕනෙ කියලා.

ගරු කථානායකතුමනි, අද අපි අනුනිත් දුෂණ විරෝධී පනත් කෙටුම්පත් ගෙනෙන එක ගැන කතා කරනවා. හැබැයි 225න් එක්කෙනෙක් මේ රටට අනිත්ක ලෙස රක්ෂක ගෙනැල්ලා, දුරකථන ගෙනැල්ලා, මම කියන්නේ රුපියල් ලක්ෂ 780ක හොර කාණ්ඩ ගෙනැල්ලා. ඒ හොර ක්‍රියාවට සිදුවෙ 10ක දඩයක් හෙලලා තිබෙන්නේ, රුපියල් ලක්ෂ 75යි. හැබැයි ඒ වගේම පාංශු පාතිකයෙක් අපේ රටට හොරෙන් රුපියල් ලක්ෂ 800ක රත්රන් ගෙනෙන හොර බිලුට රුපියල් ලක්ෂ 700ක දඩයක් හෙලලා.

මෙහෙම රටක තමයි අපි අදත් අනුනිත් අණපනත් ගෙනෙන්නේ. හොරකම් තුරන් කරන්න. රටේ ලක්ෂ 220ක ජනතාවම හිඟා වෙනවා ගරු කථානායකතුමනි.

මට මතකයි ඔබතුමාගේ ප්‍රධානත්වයෙන් පාවෙන්න පනත නායක රැස්වීමේදී කිව්වා, මේ ගරු සභාවේ පනත, විපක්ෂ දේදසයෙන් හොරෙන් හෙමේම තීන්දුවක් ගන්නවා. ඒ මන්ත්‍රීවරයා ඉල්ලා අස්වන ක්‍රියාවලියට හෙමේම පනත දේදසයන් හොරෙන් ආමේරිවාදය ලබා දෙන්න කියලා.

කිව්වා විතරයි, එක ක්‍රියාත්මක වුණේ නැහැ. ඇයි? මේ රටේ පාවෙන්නේ එතුමාගේ ජේද්දසත් වැදගත් වෙනව. මෙන්න මෙහෙම වාතාවරණයක තමයි අද අපි දුෂණ විරෝධී පනත් කෙටුම්පත් ගැන කතා කරන්නේ. පනාධිපතිවරයා කියනවා, පාතික අවශ්‍යතා වෙනුවෙන් පනතකට ඒ කියලා. National Interest එක වෙනුවෙන් එතකු වෙන්න කියලා. මම අහන්න කැමැතියි එතකු වෙන්න කියන්නේ හොරු අල්ලන්නද? හොරු බේරන්නද? එතකු වෙන්න කියන්නේ ජනතාව ජීවත් කරවන්නද? හැන්තිමි ජන ජීවිතය විනාශ කරන්නද? එතකු වෙන්න කියන්නේ ජනතාව පාලනය කරන්නද? පොලිස් ස්ථානවලට ගිහිල්ලා ඇත්ත කතා කරන්න බැරි වෙලා ඉන්න ජනතාවට ඇත්ත කතා කරන්න ඉඩ දීලා, ඒ ඇත්ත කතා කරපු අය අල්ලන්නද? බේරන්නද? එතකු වෙන්න කියන්නේ. මම විශේෂයෙන්ම අහන්න කැමැතියි. ලසන්ත විකුම්තුංගගේ මරපු අය අල්ලන්නද? බේරන්නද? එතකු වෙන්න කියන්නේ කියලා. උපාලි පෙත්තෙනෙක්ගේ අසාදුම් මේ රටේ ජනතාධිකාරීවරුන් ඒ හිංසනය දිගටත් කරපු අය අල්ලන්නද? බේරන්නද? එතකු වෙන්න කියන්නේ.

ජාතකන්තර ආයතන, ජාතකන්තර නියෝජිතයන්, දේශපාලන ආයතන, ශ්‍රමික ආයතන හමුවලදී හැම අවස්ථාවකම සමිති ජන බලවේගයන්, සමිති ජන සන්ධානයන් ප්‍රකාශ කරලා තිබෙන්නේ මේ රටේ ලක්ෂ 220ක් පමණ හැකි උපරිම උපකාර හැම විටම ක්‍රියාත්මක කරන්න, හැබැයි වැඩ කරනකොට විනිවිදභාවයෙන් යුක්තව කරන්න කියලායි. එච්චරයි කියන්න තිබෙන්නේ. මා මේ අවස්ථාවේදී මෙම කාරණයන් සඳහන් කරන්න කැමැයි. මටත් පනාධිපති වෙන්න උදවු කරවාලා, මගේ විපක්ෂ නායකකමත් රැක දෙනවාලු කියනවා. 2019 ගෝධාභය රාජපක්ෂ මැතිකුමා එක්ක එක්තනු වෙලා පනාධිපති වෙන්න මට උදවු කරපු ආකාරය මා හොඳින් දන්නවා. නමුත් මට ඒ උදවු අවශ්‍ය නැහැ. මා හිතන විදිහට අප කොහෙනවද යන්නේ, කොහෙනවද හතර වෙන්නේ කියන එක තීන්දු කරන්නේ දේශපොලන ඩිප්ලොමාදාරීන් හොඳෙයි, ඩිග් සැස්කාරකයන් හොඳෙයි. ඒවා හෙළිදරව් වෙන්නේ ඇත්ත වශයෙන්ම මේ රටේ ලක්ෂ 220ක් පමණේ මගය ප්‍රකාශ කිරීමෙන් බව මා මතක් කරන්න කැමැයි.

ඒ වගේම මා කියන්න කැමැයි, අවුරුදු 21ක් විපක්ෂ නායකකමේ පුටුව රත් කරමින් ඉන්න මගේ නම් කිසිම වුවමනාවක් නැති බව. මගේ එහෙම කිසිම බලාපොරොත්තුවකුත් නැහැ. හැබැයි, මා එක දොසක් කියන්න කැමැයි. මේ රටේ 75 වසරක ඉතිහාසයක් ගැන කතා කරන මොහොතක මා බොහොම පසෙදිලිව කියන්න කැමැයි, විපක්ෂයේ හැටියට ප්‍රථම වතාවට අපි මේ රටට අයය එකතු කිරීමක් එක්ක කර තිබෙන බව. සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තොත් රෝහල් 56කට රුපියල් ලක්ෂ 1,719ක්, රුපියල් මිලියන 171.9ක් වටිනා රෝහල් උපකරණ හා ඖෂධ පරිත්‍යාග කර තිබෙනවා.

ඒ වාගේම මා මේ කාරණයත් මේ අවස්ථාවේදී කියන්න ඕනෙ. මම හොඳ අදහස් වලින් අපි කටයුතු කරන්න වරිතමාන ජනාධිපතිවරයාගෙන් අපට කිසිම බාධාවක් ඇවිල්ලා නැහැ. මොකද, විවෘවිවරය කරන්න ඕනෙ නැත අප විවෘවිවරය කරවා හේතු, කරුණු කාරණ සහිතව. හොඳක් කියන්න ඕනෙ නැත අප හොඳක් කියනවා. හේතු කරුණු කාරණ සහිතව, විශේෂයෙන්ම වරිතමාන ජනාධිපතිවරයා, අගමැතිවරයා හැටියට විපක්ෂ නායකවරයාගෙන් කරපු ඉල්ලීම් අපට හොඳට මතකයි, ඒ වාගේම මට එය හොඳට මතකයි.

ඒ තමයි, මේ රට වෙනුවෙන් උදවු කරන්න කියන කාරණාව. ගරු කථානායකතුමනි, අපි ඔප්පු කරලා තිබෙනවා රට වෙනුවෙන් උදවු කරන හැටි. රටට බරක් වෙලා මැති ඇමැතිකම් ගන්න අපට අවශ්‍ය නැහැ. අපේ තිබෙන ස්වකීය ශක්තිය, ස්වකීය කණ්ඩායම, පෙරදැක්වීය, හැකියාව, දැනුම, දේශීය-විදේශීය සම්බන්ධකම් උපයෝගී කරගෙන අපට කරන්න පුළුවන් උපරිම වැඩසටහන් අපි ක්‍රියාත්මක කර තිබෙනවා. සැකිල්ල බස් රථ වැඩසටහන, සැකිල්ල හොරතුරු තාක්ෂණ වැඩසටහන, පුස්තක වැඩසටහන හරහා අපි ඒ කටයුත්ත ඉෂ්ට කර තිබෙනවා.

විශේෂයෙන්ම අපා පළාත් පාලන මන්ත්‍රීවරු ආපසු කැඳවීමේ පනත. ඒ පෙළඳාගැසා කෙටුම්පත ගැසට් කළ 2023.06.26 දින සිට දින සීයයක් ඇතුළත පළමු ක්‍රියාවීමත් කළා. 2023 තෙවැනි මාසයේ 5 වැනිදා. ඒ තරමට මේ රජයට උනන්දුවක් තිබෙනවා මැතිවරණයක් හොතියා විසුරුවා හැරපු පළාත් පාලන ආයතනවල මන්ත්‍රීවරුන් අපහු කැඳවන්න. ඒ ගැන ලැජ්ජායි. ඒක නිරුපද්‍රවීය ක්‍රියාවක්. ඒක නිසා මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමන්ලා හොඳෙන අනුන් පනත් කෙටුම්පත තිබෙන තත්ත්වයට වඩා හොඳයි. මම සුබාවාදී වීධියට ඒ පනත් කෙටුම්පත දිහා බලනවා. නමුත් අපි යා යුතු ප්‍රමාණය හිඟිලලා තිබෙනවාදා ඊට බොහොලොත් වෙලා. රෙට් සම්පත් විනාශ කරලා. දේශීය සම්පත්, පොදු සතනයන්ගේ සම්පත් හොරා කාලා, මිහොරෝලුකාලා. එක පවුලක් එකට එකතු වෙලා මේ රෙට් උවන්නන් විනාශයක් ඇති කරලා තිබෙනවා. හොරකම්, වංචාව, දූෂණය, මොකෝල්ලකෙම් ජාතික නාශය පතුයේ ඉහලට ගෙනැල්ලා තිබෙන මොහොතක අපි කියනවා මේ යන කුමයේ මීට වැඩිය වඩාත් සාධනීය වෙනසක් සිදු කරන්නට ඕනෙය කියලා.

ගරු කථානායකතුමනි, මේ පනත් කෙටුම්පත ගෙනෙන්නට තිබුණේ මීට පෙර. මීට පෙර වරිතමාන රජය බලයට ආපු විගසම මේක කරන්නට තිබුණා. නමුත් මේ හොල්ලන් ඇයි අද මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ? මේ කරන්නේ අයි.එම්.එෆ්. එකේ කොන්දේසියක් හැටියට. දිගු අමුලදේ පහසුකම් ලබාදීම තුළ, අයි.එම්.එෆ්. එකේ බල කිරීම තුළ 'කළ යුතු දේ' කියලා බොක්කේ ටිකක් තිබෙනවා. ටු ලිස්ට් එකක් තිබෙනවා. අපි කරන්න ඕනේ කියලා හිතනවා. කළයුතු දේවල්ලිල බොක්කේ ටික් කරන්න තමයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේ බොහොම පසෙදිලිව කියන්න කැමැතියි මේ පනත් කෙටුම්පත ශේෂ්ඨධිකරණය විසින් සංශෝධන ගණනාවක් කරලා තිබෙනවා කියලා. 29කට ආසන්න ප්‍රමාණයක් සංශෝධන කරලා තිබෙනවා. ඊට අමතරව අපිත් සංශෝධන 53කට වැඩිය ඉදිරිපත් කරලා තිබෙනවා. අමාත්‍යාංශයේය උපදේශක කාරක සභාවේදී අපි සංශෝධන ඉදිරිපත් කරන කොට රජයත් නව සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. සංශෝධන 88ක් විතර ඉදිරිපත් කරලා තිබෙනවා.

ප්‍රකාශයකින් හෝ ක්‍රියාවකින් අධිකරණයට අපහාස වන්නේ කෙසේද

අධිකරණයට අපහාස කිරීමට අදාළ නීතිය පිළිබඳව හඳුන්වාදීමට පෙර අධිකරණයට අපහාස කිරීම යනු කුමක්ද යන්න දැනගැනීම වැදගත් වේ. මිනිසා විසින් කරනු ලබන යම් ක්‍රියාවක් හෝ මිනිසා විසින් කරනු ලබන යම් ප්‍රකාශයක් අපහාසාත්මක වේද යන්න පිළිබඳ සාකච්ඡා කිරීමට පෙර අධිකරණය යනු කුමක්ද සහ යම් තැනැත්තකු විසින් කරනු ලබන ප්‍රකාශයක් හෝ ක්‍රියාවක් අධිකරණයට අපහාසයක් වන්නේ ඇයි සහ අධිකරණයට එවන් උත්තරීතරභාවයක් ලැබෙන්නේ කෙසේද යන්න සලකා බැලිය යුතුය.

මේ පිළිබඳව සාකච්ඡා කිරීමේදී යම් රටක නීති සම්පාදනය කරනු ලබන්නේ කෙසේද යන්න වැදගත් වේ. රටක ව්‍යවස්ථාදායකය විසින් නීති සම්පාදනය කරනු ලබන අතර ඒ අනුව අප රටේ නීති සම්පාදනය කරනු ලබන්නේ පාර්ලිමේන්තුව විසින් වේ. එසේ පාර්ලිමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන නීති පනාධිපතිවරයා, අමාත්‍ය මණ්ඩලය හා රාජ්‍ය සේවය යන අංග තුනෙන් සමන්විතව විය විධායකය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. මේ ආකාරයට රටේ ව්‍යවස්ථාදායකය විසින් සම්පාදනය කරනු ලබන නීති විධායකය විසින් ක්‍රියාත්මක කිරීමේදී රටේ පුරවැසියන්ට ප්‍රශ්න හා ආරවුල් ඇතිවිය හොත් ඒවා ප්‍රශ්න හා ආරවුල් විසඳීමේ බලය ඇත්තේ අධිකරණයට වේ. පවත්නා නීතිවලට අනුව අධිකරණය වෙත පැමිණෙන ජනතාවට යුක්තිය සපයමින් අධිකරණයේ කාර්යභාරය වේ. නීතියේ ආධිපත්‍යය හා නීතියේ පාලනය ඝෝෂිතවේ වීම සඳහා අධිකරණයේ ස්වාධීනත්වය අත්‍යවශ්‍ය සාධකයකි. ඒ අනුව යුක්තිය පසිඳලීම සඳහා පිහිටුවා ඇති අධිකරණය සම්පේක්ෂ ස්වේච්ඡේ ගෞරවයක් පවත්නිය යුතුමය. ඉතළ බලයක් හා ගෞරවයක් ඇති අධිකරණය විසින් දෙනු ලබන තීන්දුවක් හා තීන්දුවලට ගරු කිරීම පුරවැසියන්ගේ යුතුකමක් හා වගකීමකි. එලෙස අධිකරණය මඟින් දෙනු ලබන තීන්දුවලට අනුකූල නොවී සහ කීකරු නොවී ඊට එරෙහිව ක්‍රියා කිරීම අධිකරණයට අපහාස කිරීමක් වේ.

අධිකරණයට අපහාස කිරීමේ ක්‍රියාවන් යනු

01) නඩු අසන විවෘත අධිකරණය තුළ අධිකරණයේ ගෞරවයට හානි වන ආකාරයට හෝ අධිකරණයේ කටයුතුවලට බාධා වන ආකාරයට යම් හැසිරීමක්, යම් ක්‍රියාවක් හෝ ප්‍රකාශයක් කිරීම.

02) කිසියම් ප්‍රවෘත්තයක, රූපවාහිනී සේවාවක, ගුවන් විදුලි සේවාවක වැනි පනමාධ්‍ය මඟින් හෝ ප්‍රසිද්ධි වේදිකාවක සිට යම් පුද්ගලයකු විසින් කරනු ලබන නින්දාසහගත ප්‍රකාශයක් මඟින්.

03) අත්හිරුණුය හාවිත කරමින් අධිකරණයට නින්දාසහගත ප්‍රකාශයක් කිරීමෙන්.

04) යම් කිසි අධිකරණයක් විසින් නඩුවක් පවතින අතරතුර දෙනු ලබන නියෝගය හෝ තීන්දුවලට අවනත නොවී, එකී තීන්දු ප්‍රකාශ ක්‍රියාවේ යෙදවීමට යන අධිකරණ නිලධාරීන්ට බාධා කිරීම මඟින්.

මීට අමතරව වෙනත් යම් කිසි ක්‍රියාවක් හෝ හොකර හැරීමක් අධිකරණයට අපහාස කිරීමක් විය හැකිය.

අධිකරණයට අපහාස කිරීමට අදාළ ප්‍රතිපාදන

1) සිවිල් නඩු විධාන සංග්‍රහයේ
2) ආණ්ඩුක්‍රමික ව්‍යවස්ථාවේ
3) අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ දක්වා ඇත.

ඒ අනුව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 792 වගන්තියේ සිට 800 වගන්තිය දක්වා ප්‍රතිපාදන මඟින් අධිකරණයට අපහාස කිරීම පිළිබඳ සාරය පරිපාටිය විස්තර කර ඇත.

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 792 වගන්තිය අනුව අධිකරණයට අපහාස කිරීමේ වැරැදි හා අධිකරණයට අපහාස කිරීම වශයෙන් දඬුවම් කළ හැකි ලෙස මේ ආකාර පනතේ ප්‍රකාශ කරනු ලැබූ වැරැදි සංජානනය කිරීම හා ඒවාට ලැබෙන දඬුවම් කිරීම සඳහා වූ විශේෂ අධිකාරිය බලය ක්‍රියාත්මක කිරීමේදී සියලු අධිකාරයන්හි අනුගමනය කළ යුතු ලඝු කාර්ය පරිපාටිය මෙයට ඉහළින් එන වගන්තිවලින් නියමිත කාර්ය පරිපාටිය විය යුතුය යනුවෙන් දක්වා ඇත.

අධිකරණයට අපහාස කිරීමකට අදාළ නඩුවකදී අදාළ වූදිතයා (අපහාස කළ තැනැත්තා) වෙත අධිකරණය විසින් සිතාසියක් නිකුත් කළ යුතුය. එකී සිතාසියෙහි කරන ලද වරදෙහි ස්වභාවයද, සිතාසිය නිකුත් කිරීමේ හේතු වූ කොරතුරු හෙවත් කරුණු සිතාසියෙහි සැකකරන්නේ අදහසක් කළ යුතුය. එසේම වෝදනාවට උත්තර දීම සඳහා සිතාසියෙහි සඳහන් දිනයක අධිකරණය ඉදිරිපිට වූදිතයා පෙනී සිටිය යුතු බව අදාළ සිතාසියෙන් නියම කළ යුතුය.

වෝදනාවට උත්තර දීම සඳහා සිතාසියෙහි නියමිත වේලාවට වූදිතයා නොපැමිණෙන බවට විශ්වාස කිරීමට අධිකරණයට හේතු ඇති අවස්ථාවක, ඔහු නිරපරාධයා හැකිම පිණිස වරෙන්තුවක් සිතාසිය නිකුත් කරන අවස්ථාවේ හෝ සිතාසිය නිකුත් කිරීමෙන් පසු යම් වෙලාවක නිකුත් කිරීමට අධිකරණය බලය ඇත. ඒ වරෙන්තුව මඟින් සිතාසිය නිකුත් කිරීම පිළිබඳව හා වෝදනාව විභාග කිරීම සඳහා නියමිත දිනය පිළිබඳව තැනැත්තා ප්‍රකාශ කළ යුතුය. එසේම සිරකාරයා ගැනීමෙන් පසු වූදිතයා වෙත අත්අඩංගුවේ තබාගෙන සිටි, සිතාසියෙහි වෝදනාවට උත්තර දීම සඳහා අධිකරණයට ගෙන යා යුතු යැයි ඉන් විධානය කළ යුතුය.

කෙසේ නමුත් එලෙස අත්අඩංගුවට ගත් තැනැත්තකු අපලයක් මත මුදා හැරවීම සිදුකළ හැකිය.

යම් අපහාසයක් සිදු කරනු ලබන තැනැත්තා එකී අපහාසය අදාළ විනිශ්චයකාරවරයා ඉදිරියේ සිදු කරනු ලැබූ අවස්ථාවක එතුම්, එකී වෝදනාවට පදනම් වූ හොරතුරු විනිශ්චයකාරවරයාගේ පෞද්ගලික නිරීක්ෂණවලින් අධිකරණයට සපයනු ලබන විට, අදාළ විනිශ්චයකාරවරයා විසින් ඒ පිළිබඳව සරාගතක් සකස් කළ යුතු වේ. එවැනි අවස්ථාවකදී ඉතය සඳහන් කරන ලද කන්දුම්වල අදාළ වූදිත සම්බන්ධයෙන් කරධනු කළ හැකි අතර එවැනි අවස්ථාවකදීද සිතාසියක් හෝ වරෙන්තුවක් නිකුත් කිරීම අත්‍යවශ්‍ය නොවේ.

එසේම අදාළ නඩුව විභාග කරනු ලබන දිනයේදී අදාළ වෝදනාවෙහි සත්‍යතාව පිළිගන්නේදැයි අධිකරණය විසින් විභාග දිනයේදී වූදිතයාගෙන් අසනු ලබන අතර, වූදිත විසින් අදාළ වරද පිළිගැසීමේන් හෝ පිළිගනයනීමෙන් අනතුරුව දෙපාර්ශ්වයේම සාක්ෂි ගැනීමෙන් අනතුරුව, අදාළ වූදිත වෝදනාවට වරදකාර වන්නේ නම් අධිකරණය විසින් නියම කරන ලද දණ්ඩනයකට වූදිත යටත් විය යුතුය. එසේම කරනු ලැබූ වෝදනාවට වූදිත තැනැත්තා නිර්වැරදිකාර වන්නේ නම්, අධිකරණය විසින් අදාළ වෝදනාව නිෂ්ඵල කළ යුතු අතරම, නිෂ්ඵල කරන ලද බවට ආඥාවක් වාර්තාගත කළ යුතුය.

අධිකරණයට අපහාස කිරීමේ වැරැදි හා අධිකරණයට අපහාස කිරීමේ වැරැදි වශයෙන් වරදකාර කරනු ලැබූ තැනැත්තකුට එකී වරදකාර කිරීමට අදාළව ශ්‍රේෂ්ඨධිකරණය වෙත අභියාචනයක් කළ හැකිය. තවද එබඳු අභියාචනයකදී දීසා හා මහෙස්ත්‍රාත් අධිකරණවල සාමාන්‍ය අපරාධ අධිකරණ බලය අනුව කරනු ලැබූ ආඥාවකට විරුද්ධව අභියාචනා කරනු ලබන ආකාරයටම අපරාධ නඩු විධාන සංග්‍රහයේ නියමිත කාර්ය පරිපාටිය අනුගමනය කළ යුතුය.

ආණ්ඩුක්‍රමික ව්‍යවස්ථාවේ 105 (3) ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා පනරජයේ ශ්‍රේෂ්ඨධිකරණය සහ ශ්‍රී ලංකා පනරජයේ අභියාචනාධිකරණය එක් එක් අධිකරණය ලේඛනගත කිරීමේ හෙළඹේ අධිකරණයක් වන්නේය. පසළ අධිකරණයේදීම හැකෙන්නේ අන් ස්ථානයකදී ඒ අධිකරණයන්ට අපහාස කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨධිකරණය හෝ අභියාචනාධිකරණය සුදුසු යැයි සලකන පරිදි බන්ධනාගාර ගත කිරීමේ හෝ දඩයකින් හෝ බන්ධනාගාර ගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකෙන්ම හෝ දඬුවම් කිරීමේ බලය එබඳු අධිකරණයක සියලු බලතල ඒ අධිකරණයට ඇත්තේය.

1978 අංක 02 දරන අධිකරණ සංවිධානය පනතේ 18 සහ 55 වගන්තිවලින් මහාධිකරණයට අපහාස කිරීමට අදාළ ප්‍රතිපාදන දක්වා ඇත.

මහාධිකරණයේ අධිකාරියක් විරුද්ධව හෝ ඊට අගෞරවව වන පරිදි හෝ සිදු කරනු ලැබූ යම් අපරාධ වරදක් සංජානනය කිරීමටත් ලෙඩ ක්‍රමයට විභාග කිරීමටත් වරදකාරය කරනු ලැබූ පසු ඒ වරදකාරය අවුරුදු 05 හොඳකින්වත් සාමාන්‍යයෙන් බන්ධනාගාර ගත කරන ලෙස කිරීම කිරීමටත් මහාධිකරණයට බලය හා අධිකාරිය තිබිය යුතුය. ඒ බන්ධනාගාරගත කිරීම අධිකරණය විසින් විධාන කරන පරිදි බරපතළ වැඩ ඇතිව හෝ නැතිව හෝ විය යුතු අතර ඊට අතිරේකව හෝ ඒ වෙනුවට හෝ අධිකරණයේ අභිමතය පරිදි නියම කර ඇති මුදල් ප්‍රමාණය හොඳක්මවන දඩයක් ගෙවන ලෙසද නියම කරනු ලැබිය යුතුය.

අධිකරණයට අපහාස කිරීමේ වෝදනාවට වූදිතයකු වරදකාර කිරීමට නම් එකී වෝදනාව මිථ්‍ය කිරීමේ කාර්ය කොකෙක්ද යන්න දැනගැනීම වැදගත් වේ. නඩු තීන්දු රැසකයි මේ අදාළ පරිදි අධිකරණයට අපහාස කිරීමේ වෝදනාව, අපරාධ නඩුවකදී මෙන්ම සිවිල් නඩු සැකයෙන් ඔබිවට මිථ්‍ය කිරීම අනාවරණ වන බව පහළදිලි වේ.

1971 අංක 21 දරන බෙදුම් නඩු පනතේ දක්වා ඇති අන්දමට, බෙදුම් නඩුවකදී අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක, ඒ නඩුවේදී කරන ලද සෑම ආඥාවක්ම හෝ තීන්දු ප්‍රකාශයක්ම බලාත්මක කිරීමේදී

(අ) එබඳු යම් ආඥාවකට අකීකරු වන හෝ

(ආ) අධිකරණයේ බලය යටතේ කටයුතු කරන හෝ මේ පනතින් තමා වෙත පවරන් ඇති යම් බලයක් ක්‍රියාත්මක කරන යම් තැනැත්තකුට අවහිර කරන හැකහොත් විරෝධය පාන හෝ

(ඇ) 31 වන වගන්තිය යටතේ නඩුවට අදාළ ඉඩමෙහි සාදා ඇති හෝ පිහිටුවා ඇති යම් ඖෂධී සැලකුණකට නඩුව පාවිච්චි භාවි කරන, එය විභාග කරන හෝ ඉවත් කරන කවිර වූ හෝ තැනැත්තකුට අධිකරණයට අපහාස කිරීමේ වරදකාර මේන් දඬුවම් කිරීමේ බලය තිබිය යුතුය.

නිහිඳු ගංගා ජයංගනී සෝමවර්තන
නීති නිලධාරි
නීති ආධාර කොමිෂන් සභාව
කොළඹ.

දෛනික ජීවිතයේදී මව්බිම පාඨකයන් මුහුණ දෙන ප්‍රශ්න ගැන සෑම පත් කරන නීතිමය ප්‍රශ්න පිටුවෙන් පිළිතුරු ලබාදේ. නීති ආධාර කොමිෂන් සභාවේ විද්වත් නීතිඥ කණ්ඩායමක් සම්පිළිතුරු කරනු ලැබේ. ඔබේ ගැටලුව මව්බිම ලිහුල් ඒඩ්, නීති ආධාර කොමිෂන් සභාව, 129, මහාධිකරණ සංකීර්ණය, අලුත්කඩේ, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ ඊමේල් legalaidcommission@yahoo.com වෙත යොමු කරන්න.

උදෙසේ සහ ලිපි සැකසුම
නීතිඥ දර්ශිකා මඩුගල්ලල
නීතිඥ ලක්ශිනි අමරසිංහ
නීති නිලධාරි
නීති ආධාර කොමිෂන් සභාව